## විප්ලවය අත ළඟයි

ලංකාවේ නිර්ධන පන්ති විප්ලවය සිදුවෙන්න අත ළඟයි කියලයි මට දැනුණෙ මේ පාර කම්කරු මැයි දින පෙළපාලි වලට සහභාගිවුණ කම්කරු ජනතාවගේ ප්‍රමාණය දැකලා. අම්මපා මේ සෙනග කන්දරාවෙන් එක විප්ලවය දෙවෙයි විප්ලව දෙක තුනක්ම කරන් ඇහැකිනෙ.. කම්කරුවන්ගෙ දිනේ වේදිකාවලින් ඇහුණ කතා වලිනුත් කම්කරු පන්ති ජීව ගුණය දොරේ ගලා ගියා. ඒ කතා වලට පහළ හිටිය කම්කරු ජනතාව



අත්පොළසන් දෙන හැටිත් දැක්කා. යමක් දන්න කියන කාලෙ ඉඳලම විප්ලවය ගැන හීන මවපු මට මාර ජොලි.

අනේ ඇත්තටම අපට වෙච්ච දෙයක්. මේ තරම් අමන මිනිස්සු රැළක් ඉන්න රටක්.. අපේ ජීවිත කාලය තුළ නම් මේ රට ගොඩදාන්න බැරි බව නම් ඒකාන්තයි. අපේ රට ගොඩගන්න නම් අපත් ඇතුළු මේ දැන් ඉන්න පරම්පරාවම අවසන් වෙන්න ඕනෙ. මේ පරම්පරාව රට හදන්නෙත් නැහැ හදන්න දෙන්නෙත් නැහැ හදන්න තේරෙන්නෙත් නැහැ. මේක යන්නෙ මේ විදිහට නම් අපිත් මැරිලා මේ ඉන්න දේසපාලුවොත් මැරිලා අල්ත් විදිහට හිතන වැඩකරන සෙට් එකක් ඇවිත් මේක ගොඩදාන්න ඕනෙ. අපිට ඒක දකින්න වෙන්නෙ නැති නිසා ප්‍රාර්ථනා කරමු. අපි වගේ තල ඉහලා මුං ගන්න හදන්නෙ නැති තල ඉහලා තලම නෙලන්න පුලුවන් පරපුරක් හැදෙන්නයි කියලා.

## පාස්කු කතා

වෙසක් නත්තල් ගැන හැම අවුරුද්දකම මොකක් හරි සටහනක් ලිව්වත් පාස්කු ගැන කවදාවත් කතා කරන්නවුණේ නැහැ. හැමදාම කලේ පාස්කු වෙනුවෙන් ලැබෙන නිවාඩු දවස් හතර කොහේ හරි ගත කරන්න යොදා ගන්න එක විතරයි.
ජේසු තුමන් කුරුසියේ ඇණ ගැසීමේ සිට යලි උට්ඨාන වීම දක්වා සිදුවූ සිද්ධි අනුස්මරණය කරමින් පැවැත්වෙන පාස්කු උත්සවය ලංකාවේ නම් ජයටම ගන්නවා. ලංකාවේ කරපු ඒ චාරිත්‍ර මෙහෙ ඇවිල්ලත් කරන එක වැදගත්. හැම මිනිහෙක්ම තමන්ගෙ ආගම



අදහන්නේ එයින් තමන්ට ලැබෙන සැනසීමත් අනෙකාට දැක්විය හැකි දයාවත් කරුණාවත් වෙනුවෙන් ආගමෙන් කෙරෙන මග පෙන්වීම නිසාත් නේ. කවුරු උනත් බෞද්ධ කතෝලික ක්‍රිස්තියානි හින්දු ඉස්ලාම් කියලා වෙනසක් නැහැ. ආගම් තමන්ට රිසි සේ අදහන එක ඉතා හොඳයි. ඒක තමන්ගේ විතරක් කරගන්නේ නැතුව.
ආගම් කියන්නෙ පොදු දේවල්. කොයි ආගමෙන් පදනම තමයි කරුණාව දයාව හා සහජීවනය. ආගම පුද්ලකි බූදලයක් කරගෙන අදහන්න ගියාම තමයි ගැටුම් හටගන්නෙ. ඉතිහාසය පුරාම ධර්ම යුද්ධ කුරුස යුද්ධ ඇති වෙලා තියෙන්නෙ මං පොර න්‍යායෙන් ආගම් අදහන්න ගිය කට්ටිය නිසා තමයි.

චූටි මල්ලි නම් හිතන්නෙ **ලෝකෙට පේන්න මොන දේ කළත් වැඩක් නැහැ තමන් තුළ ඉන්නා යක්ෂයා දමනය කරගන්නෙ නැතුව.** පටන්ගන්න ඕනෙ තමන්ගෙන්මයි. ඒ යක්ෂයා හිත ඇතුළේ තියාගෙන දඹදිව ගියත් මක්කම ගියත් ශුද්ධ වූ දේශයට ගියත් කොච්චර දන් පින් දුන්නත් වැඩක් නැහැ. පලක් නැහැ. මට මේව මෙහෙම ලියන්න හිතුණේ පහුගියදාක අහන්න ලැබුණ කතාවක් නිසයි. මෙහෙම දේවල් වෙන එකට ඉතින් මිනිස්සුන්ට විතරක් දොස් කියලා වැඩක් නැහැ. ඕව උගන්නන මිනිස්සුත් වග කියන්න ඕනෙ.

අපට හැමදාම අහන්න ලැබෙන්නෙ සමාදානයේ සැතපෙන එක විතරයි. සමාදානයෙන් ජීවත් වෙන්න කියන එක නම් අහන්න ලැබෙන්නෙම නැහැ.

## දෙබසක්

මේ දෙබස මෙල්බන් නුවර වසන අක්කා කෙනෙක් සහ එක්තරා ප්‍රසංගයකට ලංකාවේ සිට ඉම්පෝට් කළ නිවේදක අයියා කෙනෙක් අතරයි වෙන්නෙ.

ප්‍රසංගයේ ආරම්භක පූජා නැටුම නටන්න මල් වගේ පුංචි දරුවන් පිරිසක් අරගෙනයි අක්කා ඇවිත් හිටියෙ. බොහොම දුර ඉඳන්.. දරුවන් ප්‍රසංගය පටන් ගන්න කලින් පුංචි



පෙරහුරුවකත් යෙදෙනවා. ඉම්පෝට් කළ නිවේදක අයියා තරහෙන් එතනට එනවා. ඔන්න දෙබස පටන් ගන්නවා.

අයියා - කවුද මේ ළමයි එක්කගෙන ආවෙ
අක්කා - මමයි
අයියා - ඔහේ මොන ආගමේද
අක්කා - මම කතෝලික
අයියා - ඒක තමයි ඔහේ මේව දන්නැත්තෙ.. මේ විදිහට පූජා නැටුම් නටන්නෙ නැහැ.. මට මේ නැටුම අවශ්‍ය නැහැ..
අක්කා - අනේ මේ දරුවෝ හුගක් දුර ඉඳන් ඇවිත් ඉන්නෙ.. බලන්න ඒගොල්ලො නැටුමට ඇඳුනුත් ඇඳගෙනයි ඉන්නෙ..
අයියා - ඒකට කමක් නැහැ. මේ නැටුම නැතුවට මට මේ ෂෝ එක කරගෙන යන්න පුලුවන්
අක්කා - ඒ කියන්නෙ නැටුම ඕනෙ නැද්ද
අයියා - නැහැ.. අවශ්‍ය නැහැ..
අක්කා (කණගාටුවෙන් දරුවන්ට) - පුතාලා දුවලා.. අද අපි නටන්නෙ නැහැ.. අපි ගෙදර යමු.. මේ මාමට වැඳලා එන්න..

දරුවො මැළවුණ මූණු වලින් අර නිවේදක අයියට වැඳලා ආපහු ගෙවල් වලට ගියා. ඒ නිවේදක අයියගෙ පාහර වැඩේට විරුද්ධ වෙන්න කොන්ද පණ තිබ්බ එක අයියෙක්වත් එතැන හිටියේ නැහැලූ. මොකද ඉම්පෝට් කරන නිවේදක අයියලා හරිම වටිනවාලූ.


ඒක පැත්තක දාමුකෝ. පහුවෙලා හරි කෝල් එකක් දාලා වෙච්ච වැඩේට සමාවෙන්න කියලා කියන්න තරම්වත් ආචාරශීලී බවක් සංවිධායකයන්ට තිබ්බා නම්.. පුංචි හිත් මල් වගේ.. ඒව තලාදාන්න එපා සහෝදරවරුනි.

## අප්‍රේල් විරු සමරුව

මෙල්බන් නුවර අප්‍රේල් විරු සමරුව බලන්න ගියා. ගිය පාරත් ඔලූව දාලා ආවා. මේ පාර පොඩි ප්‍රගතියක් තිබුණා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. එච්චර තමයි. අවුරුද්දකට සැරයක් මේක මෙහෙම හරි වෙන එක හොඳයි. හිතට දුකයි. ඒත් බෝපගේ සහෝදරයා බිරිඳත් එක්ක විමුක්ති ගී ගයනවා දැක්කම මොකක්ද සතුටක් හිතට දැනුණා. පොත් දෙක තුනක් අරන් රෑට කාලා තේ බීලා ජයවේවා කියලා ආපහු ආවා.. ලබන අවුරුද්දෙ ආයෙම හමුවෙන අදහසින්..

## වෙසක් වෙසක්

වෙසක් ආයෙමත් ඇවිදින්. වෙසක් එකට බකට් එකක් පහන් කූඩුවක් දකින දකින වාරයක් පාසා මට ජී බී සේනානායක මහත්තයගෙ කෙටි කතාවක් වන වෙසක් කූඩුව මතක් වෙනවා. ඒකෙ අර අයියගෙයි නංගිගෙයි කූඩුව පිච්චෙන දර්ශනය මොන හේතුවක් නිසාද මන්දා චිත්‍රයක් වගේ මගේ හිතේ ඇඳිලා තිබුණා. ඒත් දැන් දැන් ටිකෙන් ටික ඒක මතකයෙන් ගිලිහිලා යමින් තියෙනවා. වෙසක් එනකොට මතක් වෙන්නෙ හාමුදුරුවන්ට සහ බුද්ධාගමට මොකද වෙන්න කියලා. මාරයි කියන්නෙ ලංකාවෙත් මෙහෙත් තරුණ පරපුර ආගමත් එක්ක තියෙන බැඳීම වැඩි වෙලා තියෙනවා කියලා අහනවා දකිනවා. ඒක හොඳයි. අපේ කාලේ අපි පන්සල් එක්ක සෙට් උනේ වැඩි පුරම ආමිස පූජාව සඳහා වන කටයුතු වලටමනෙ. ඒත් දැං කට්ටිය ආමිසයට වඩා ප්‍රතිපත්ති වලට දර්ශනයට නැඹුරුවෙන බවක් අහන්න ලැබෙනවා. ඒකට මෑත කාලෙය් බිහිවුණ ස්වාමින් වහන්සේලා මුල් වුණ බව තමයි ආරංචිය. අවුරුදු 2500 කට පස්සෙ බුදු සසුන යන්නේ අවරටයි. 3000 ත් 4000 ත් වෙනකොට හාමුදුරුවරු අඳුනගන්න වෙන්නෙ අතේ බැඳලා තියෙන පිරිත් නූලකින්ය කියලත් අපි අහල තිබුනානෙ. එහෙව් එකේ මෙහෙම



සෝවාන් රහත් වෙච්ච කට්ටිය ඉන්නව කිව්වම හිතට දැනෙන්නෙ සතුටක්. ඒ නිසාම පහුගිය ටිකේ ඒ ගැන හොයලා බැලූවා. පොඩ්ඩක් වෙන්න හැදෑරුවා. වැඩේ තියෙන්නෙ මේ උන්නාන්සේලා කියන කතා සේරම ඇත්ත. ඒත් ඒ විදිහට කරන්න ගියොත් මේ සාසනේ කී දෙනෙක් ඉතුරුවෙයිද. සත්‍යයම සොයන්න කියලා දේශනා කරන කිසිවෙක් මේ කියන රහතුන් සමග වාදයට යන්නෙ නැහැ. එහෙම වෙන්නෙ ඇයි. බුදුන් තවුසන් කී දෙනෙක් එක්ක නම් වාද කළා ද. තර්ක කළා ද. එතකොට අපි දන්නේ අදහන්නේ පිරිසිදු ධර්මය නොවේද කියලා පොඩි විචිකිච්චාවක් ඇති වෙනවා. මේවා ගැන හොයන්න ගියහම මේ නිසාම පොඩි සංගභේදයකුත් ඇති වේගන එන සයිස් එකක් කියලත් ආරංචියි. මධ්‍යස්තව බලන හැමෝම ඇහුවම කියන්නෙ උන්නාන්සේලා කියන දේවල් නම් ඇත්ත ඒත් කරන දේවල් නම් ෆුල් අවුල් කියලා. ඉතින් අපි කොහොමද අප්පා නිර්මල සත්‍යය සොයන්නෙ.

අන්තර්ජාලයෙ යන කෝමල බණ පිරිත් අහලා මට ඇති වෙලා ඉන්නෙ. ඒ නිසාම මට හිතෙන්නෙ සත්‍යය සෙවිල්ල පැත්තකින් තියලා පරණ පුරුදු විදිහටම මැටි පහනක් බකට් එකක් හදාගෙන වෙසක් සමරන්න.

## ආයෙත් පෝලින්

කාලෙකට පස්සෙ පෝලින් ඇන්ටිව දැක්කා. එයා තාම ගේම අතෑරලා නෑ වගේ. කියන සමහර දේවල යම් ගතයුත්තක් තිබුණත් එයා ඒව ඉදිරිපත් කරන විලාසය නිසා ඒවයෙ තියෙන විශ්වසනීයත්වය බිඳිලා යනවා. කලින් තිබ්බ දැඩි ආසියා විරෝධය හංගාගෙන මුස්ලිම් විරෝධය තමයි දැන් මතුකරන්නෙ. ඇය ආමන්ත්‍රණය කරන්නෙ රටේ සියලුම පුරවැසියන්ට නෙවෙයි. සුදු ජාතිකයන්ට පමණයි. ඔවුන්ගේ ඔලුව නෙවෙයි පපුවයි ඇය ඉලක්ක කරගන්නෙ. ඒක සාර්ථක බව පහුගිය මැතිවරණ වලින්



පෙනුණා. අන්තර්ජාලයේ තිබුණ වීඩියෝවක ඇය ජනතාව ආමන්ත්‍රණය කරන හැටි දැක්කා. එහිදී ඇය සුප්‍රකට චොක්ලට් වර්ග දෙකක් පෙන්වමින් කළ කතාව දැක්කම මෙරට දේශපාලකයින් වැටී ඇති තත්වය ගැන ඇතිවුණේ දුකක්. වැඩේ කියන්නෙ අපේ මිත්‍රයන් ගොඩ දෙනෙක් මේ දවස් වල පෝලින්ට කැමතියිනෙ. කට්ටිය කියන්න හම්බයන්ට පහර දෙන්නම ඕනෙ කියලයි. මේ කට්ටියට මුස්ලිම් පේන්න බැහැ. දෙමළ පේන්න බැහැ. ඉන්දියන ඇෆ්ගන් පේන්න බැහැ. ඕනෙ සිංහල බෞද්ධ විතරමයි. එහෙම පුලුවන්ද? මේ හැම එකාම මිනිස්සු කියලා හිතන්න බැරි මොකද? විවිධ ගතිගුණ සහ ක්‍රම සහ විධි තිබුණත් උනුත් අපි වගේම මේ රටට ආව මිනිස්සුනේ. මේ හැම දෙනාම මේ රටේ පොදු නීතියට යටයිනෙ. ඒකෙන් පිට පනිනවා නම් ඒක වළක්වන්න පුලුවන්නෙ උන්ට වෛර කරන්නෙ නැතිව.
ඒ නිසා නීතියේ ආධිපත්‍යය සමසේ ක්‍රියාත්මක වන ආකාරයට ඒ ආයතන වලට තල්ලුවක් දෙනවා වෙනුවට පෝලීන්ට හරි එයාගෙ අදහස් වලට බැක් කරන්න ගියොත් මේ සමාජයට දෙයියන්ගෙම පිහිටයි. එයා ලබ්බට තියන අතම පුහුලටත් තියන බව තේරුම් ගන්න මහ ලොකු මොළයක් ඕනෙ නැහැ. ඒක ඔය කවුරුත් තේරුම් ගන්න ඕනෙ.

**චූටි මල්ලි**